# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2016-02-15 |

පැමිණිලිකරුවන් : මහානාම උපාලි ජයවර්ධන මයා.
අංක 392/A. කඩුවෙල පාර.
මාලඹේ.

සිසද දිනුජය ජයවර්ධන මයා - අගතියට පත් බාල වයස්කාර තැනැත්තා

වගඋත්තරකරුවන් : 01. ෆ්‍රැන්සිස් වෙලගේ මයා.
උප විදුහල්පති.
ආනන්ද විද්‍යාලය.
කොළඹ 10.

02. විදුහල්පති.
ආනන්ද විද්‍යාලය.
කොළඹ 10.

පැමිණිලි අංකය : HRC/1862/15/I-23

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. කොළඹ ආනන්ද විද්‍යාලයේ 12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන වයස අවුරුදු 17 ක් වන උක්ත අගතියට පත් තමාගේ දෙවැනි දරුවාට ආනන්ද විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිවරයා විසින් පහර දුන් බවට 2015.05.27 දින පෙ.ව. 8.15 ට පමණ තමාගේ වැඩිමහල් පුතා විසින් තමාට දැනුම් දුන් බවයි.

පසුව තම දෙවැනි දරුවා වන අතෘප්තියට පත් තැනැත්තා තමාට දුරකථනයෙන් කථා කර සිද්ධිය දන්වා සිටි බවත්, ඔහු ආනන්ද විද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානයේ සිටින වෛද්‍යවරයා වෙත යොමු වූ බව තමාට දැන්වූ අතර. පසුව තමාද පාසලට ගිය බවත්. එහිදී තමා ඒ පිළිබඳ

විදුහල්පතුමාට කරුණු දැක්වීමේදී ඒ අසල සිටි ගුරුවරයකු තමාට බැණවැදුණු බවත්, ඔහු පළවන වගඋත්තරකරු වන තම පුතාට පහර දුන් ගුරුවරයා බව පසුව දැනගත් බවත් සඳහන් කර ඇත.

පසුව තමා දරුවා ජාතික රෝහලට ඇතුළත් කළ අතර ඉන් අනතුරුව රෝහල් පොලීසිය වෙත පැමිණිලි කළ බවත් පසුව මරදාන පොලීසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවත්, ඒ අවස්ථාවේ පළවන වගඋත්තරකරු ඊට පෙර පැමිණ තමාට විරුද්ධව පැමිණිල්ලක් කළ බවට තමාට දැනගැනීමට ලද බවත් සඳහන් කර ඇත.

පසුදින සවස දෙවන වගඋත්තරකරු තමාට දුරකථනයෙන් අමතා තමාගේ දරුවාට සිදු කළ පහරදීම සම්බන්ධ සිද්ධිය දුරදිග නොයෙන ලෙස කටයුතු කරන ලෙසට තමාට එහිදී ඔහු දැන්වූ බවත් ජාතික රෝහලේ දරුවාට අනාරක්ෂිත බවක් ඇති බව තමාට දැණුන නිසා තමා ඔහුව නිවසට ගෙන යාමේදී ඔහු වමනය කළ බවත්, පවුලේ වෛද්‍යවරයාගේ උපදෙස් මත ඇස, කණ, නාසය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු හා කායික වෛද්‍යවරයකු වෙත යොමු කළ බවත්, පසුව මනෝ වෛද්‍ය ජයාන් මෙන්ඩිස් මහතා වෙතද යොමු කළ බවත් සඳහන් කර ඇත.

2015.06.04 දින හා ඊට ආසන්න දිනයකදී විද්‍යාලය මගින් කළ ඉල්ලීමට අනුව බිරිඳ, තමා හා දරුවා පාසලට ගිය අතර මේ පිළිබඳ සාකච්ඡාවක් පැවැත්වූ නමුත් පහරදීම සම්බන්ධව පළවන වගඋත්තරකරුට ගන්නා ක්‍රියාමාර්ගයක් සාකච්ඡා නොවුණු බවත්, මේ පිළිබඳ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී/11983/15 යටතේ නඩුවක් පවතින බවත් සඳහන් කර ඇත.

තමා බලාපොරොත්තු වූ සහනය වනුයේ දරුවාට සිදු කළ වධහිංසාව සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගැනීම බවද වැඩිදුරටත් පැමිණිල්ලෙන් දක්වා ඇත.

**අගතියට පත් තැනැත්තාගේ ප්‍රකාශය :-**

2015.05.27 දින තමා පාසලට ගියවිට පාසල් ගේට්ටුවෙන් ඇතුළු වූ පසු ශිෂ්‍ය නායකයෙකු විසින් තමාව වැරදි පෝලිම වෙත යොමු කළ බවත්, තමා වැරදි පෝලිමට යොමු කිරීමට හේතුව වශයෙන් දක්වන ලද්දේ තමාගේ හිසකෙස් ප්‍රමාණයට වඩා වැඩිවීම බව දැනගත් බවත් ඒ අවස්ථාවේ 13 වසරේ වැඩිමහල් ශිෂ්‍යයෙක්ද පාසල් නීතිරීතිවලට පටහැනිව කළු කලිසමකින් සැරසී පැමිණි බවත්, ඔහුගේද කොණ්ඩය වැවී තිබුණු අතර එම සිසුවා හා ශිෂ්‍ය නායකයෙක් අතර බහින් බස්වීමක් සිදු වූ බවත්, පසුව එම සිසුවා හා ෆ්‍රැන්සිස් වෙලගේ - නියෝජ්‍ය විදුහල්පතිතුමා අතරද බහින් බස්වීමක් සිදු වූ බවත්, පසුව නියෝජ්‍ය විදුහල්පතිතුමා 13 වසරේ සිසුවාට කණ හා කම්මුල ආශ්‍රිත ප්‍රදේශයට පහර දුන් ආකාරය තමා දුටු බවත් සඳහන් කර ඇත.

පසුව තමාට කථා කර එම ස්ථානයේදී කිසිදු ප්‍රශ්න කිරීමකින් තොරව තමාගේ කණ සහ කම්මුල ආශ්‍රිත ප්‍රදේශයට දැඩිව පහරක් එල්ල කළ අතර එම අවස්ථාවේ තමාට ක්ලාන්ත ගතියක්, කැරකිල්ල වැනි හැඟීමක්ද මුහුණේ පහර වැදුණු ස්ථානයේ විශාල වේදනාවක්ද ඇති වූ බවත්, තමාට පැහැදිලි කිරීමට අවස්ථාවක් ලබා නොදුන් නමුත්, තමා ඒ අවස්ථාවේ තමාගේ කණගාටුව පළ කළ බවත්, එහිදී තමාට එම සිදුකළ පහරදීම නිසා ලැජ්ජාවක් හා අවමානයක් ඇති වූ බවත් දක්වා ඇත.

එම අවස්ථාවේදී තමාට දැණුනු කැරකිල්ල සහ ක්ලාන්ත ගතිය නිසා එතැන සිටි පාසල් ශිෂ්‍යයකු අසල තිබූ ආසනයක තමා වාඩි කරවා, තමාට වතුර වීදුරුවක් ලබා දුන් අතර, විනාඩි 15 කදී තම කම්මුල ඉදිමීමකට ලක් වූ බවත්, තමාව කරණවැමියා වෙත යොමු නොකර ශිෂ්‍ය නායකයෙකු විසින් තමාට පන්තියට යාමට දැන්වූ බවත් සඳහන් කර ඇත.

තමා අපහසුවෙන් පන්ති කාමරයට ගිය නමුත් තමාගේ තත්ත්වය දුටු මිතුරන් තමාව පාසලේ වෛද්‍ය මධ්‍යස්ථානයට යොමු කළ බවත්, එහිදී තමාට බෙහෙත් වර්ග ලබා දුන් බවත්, නමුත් කණ පරීක්ෂා කිරීමේ උපකරණයක් නොමැති නිසා කණ රෝහලෙන් පරීක්ෂා කර ගන්නා ලෙසට එම වෛද්‍යවරයා විසින් තමාට උපදෙස් දුන් බවත් සඳහන් කර ඇත.

ප්‍රතිකාර ගැනීමෙන් පසු තමා තම වැඩිමහල් සහෝදරයාට කථා කර ඔහුට දැන්වීමෙන් අනතුරුව කලා අංශය භාර ගුරුතුමිය එම ස්ථානයට පැමිණි අතර පන්ති කාමරයේදී ඇය සිද්ධිය විමසා තේ සාදා දුන් බවත්, පසුව තමාට වමනය ගිය බවත්, තමා පිළිබඳව පන්තිභාර ගුරුතුමා වෙලගේ මහතා සමග කථා කළ බවත්, ඒ අනුව තමාගේ නම නාමලේඛනය ලකුණු කර තිබේ නම් දෙමාපියන්ට භාර දෙන ලෙසත් එසේ නොවේ නම් නිවසට තනියම යාමට ඉඩ දෙන ලෙසත්, එහිදී ඔහු දන්වා ඇති බවත් පසුව තමා පියාට කථා කිරීමෙන් පසුව ඔහු පැමිණ තමාව රෝහල් ගත කළ බවත් දක්වා ඇත.

**පළවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

වගඋත්තරකරු ලිඛිතව දිවුරුම් ප්‍රකාශ මගින් කරුණු ඉදිරිපත් කරමින් දක්වා ඇත්තේ පැමිණිල්ල මගින් කිසිවෙකුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් හෙළි නොවන බවයි.

පාසලේ විනය පවත්වාගෙන යාමේ අරමුණින් කරන ලද සත්භාවී තරවටු කිරීමක් හැර විද්‍යාලයේ කිසිවකු විසින් අතෘප්තියට පත් තැනැත්තා ලෙස දක්වන සිසුවාගේ මුහුණ ප්‍රදේශයට කණට හා කම්මුලට පහරදී නොමැති බවත් පැමිණිලිකරු ද්වේශසහගතව විද්‍යාලයට සම්බන්ධ වෙනත්

කණ්ඩායමක් සමඟ එංක සහයෝගයෙන් කටයුතු කරමින් සිදු නොවූ සිදුවීමක් පිළිබඳව මරදාන පොලීසියටත් ළමා ආරක්ෂණ අධිකාරියටත් පැමිණිලි කර ඇති බවත් සඳහන් කර ඇත.

තමාව නියෝජ්‍ය විදුහල්පති ධුරයෙන් ඉවත් කිරීම සඳහා පදනම් විරහිතව කටයුතු කරන බවත් දිනපතාම පාසල් සිසුන් කොණ්ඩය නොකැපීම හේතුවෙන්, කායික හා මානසික වධහිංසනයකට ලක් නොවන ආකාරයෙන් තරවටු කිරීම විනය පාලක ගුරුභවතුන් විසින් සිදු කරන බවත්, තමා විනය මණ්ඩලයේ සභාපති හා නියෝජ්‍ය විදුහල්පති මෙන්ම ශිෂ්‍ය නායක බණ්ඩය භාර ආචාර්යවරයාද වන බවත් එබැවින් තමාට පාසලේ විනය හැඩගැස්වීමෙහිලා වගකීමක් ඇති බවත් සඳහන් කර ඇත.

හිංසා කිරීමට අදාළව වෛද්‍ය සහතික පැමිණිලිකරු ඉදිරිපත් කර ඇති බවත්, පැමිණිලිකරු ඉදිරිපත් කළ ඡායාරූප ව්‍යාජ ඡායාරූප බවත් මේ වනවිටත් මෙම අතෘප්තියට පත් තැනැත්තා හා ඔහුගේ සහෝදරයා කිසිදු ගැටළුවකින් තොරව පාසලට පැමිණෙන බවත් දක්වා ඇත.

එසේම මෙම පැමිණිලිකරු 2015.05.27 දින පාසලට අනවසරයෙන් ඇතුල් වී තමාගේ හා විදුහල්පතිතුමාගේ ගෞරවය කෙලෙසන ආකාරයෙන් හැසිරීම පිළිබඳව තමා 2015.05.27 දින CIB-268/352 යටතේ පැමිණිල්ලක් කළ බවද වැඩිදුරටත් දන්වා ඇත.

**දෙවන වගඋත්තරකරුගේ ලිඛිත ප්‍රකාශය :-**

පාසල තුළ විනය පවත්වාගෙන යාමේ අරමුණින් සෑමදිනකම සිසුන් විනයානුකූල උපදෙස් අනුව පාසලට පැමිණෙන්නේද යන්න නිරීක්ෂණය කරන අතර සිද්ධිය වූ දිනද එම අධීක්ෂණ කටයුත්ත වූ බවත්, කිසියම් විනය පටහැනි හැසිරීමකට සහ/හෝ සිදුවීමකට දරුවකු සම්බන්ධ බව හැඟී යන විට මුලින්ම ශිෂ්‍ය නායකයින් අවවාද කරන බවත්, එසේ දෙතුන් වතාවක් අවවාද කිරීමෙන් පසු නොපිළිපදින අවස්ථාවලදී ඒ පිළිබඳව විනය පාලකවරයාට දැනුම් දී සිසුන්ට අවවාද කරන බවත් සඳහන් කර ඇත.

මෙම පැමිණිලිකරුගේ දරුවාටද විනයට නොගැලපෙන ලෙස කොණ්ඩය වවා තිබීම මත අඛණ්ඩව දින දෙක තුනකදී ශිෂ්‍ය නායකයින්ගෙන් අවවාද ලබා ඇති අතර එකී අවවාද නොසලකා හැරීම නිසා ශිෂ්‍ය නායකයින් සමඟ බහින්බස්වීමට ක්‍රියාකිරීම හේතුකොටගෙන ඒ පිළිබඳව විනය භාර ගුරුවරයකු වූ ලක්ෂ්මන් කුමාර පෙරේරා මහතාට දැනුම්දීමෙන් පසු ඔහු වගඋත්තරකාර නියෝජ්‍ය විදුහල්පති වෙත දැනුම් දුන් බවත්, එම අවස්ථාවේදී සියලුම ශිෂ්‍යයන් ඉදිරියේදී එම ශිෂ්‍යයාට තරවටු කිරීමක් පමණක් කර ඇති නමුත්, කිසිවිටකත් එම දරුවාට පහරදීමක් සිදු කර නොමැති බවට දන්වා ඇත.

මෙම සිදුවීම වූ දින පැමිණිලිකරුගේ දරුවන් දෙදෙනා සාමාන්‍ය පරිදි පන්ති කාමරවල කටයුතු කළ අතර පැමිණිලිකරුගේ කිසිදු දරුවකු විද්‍යාල භූමියේදී කායික හෝ මානසික හිංසනයකට ලක් කර නොමැති බවත්, තමාට කිසිදු ආකාරයකින් පැමිණිලි නොලැබුණු බවත් සඳහන් කර ඇත.

එදිනම දහවල් 12.30 ට පමණ මෙම පැමිණිලිකරු විද්‍යාලයේ ආරක්ෂක අංශවල අවවාද පවා නොතකා වාහනය විද්‍යාලය තුළට ගෙන, තමා හා නියෝජ්‍ය විදුහල්පතිවරයා ඉදිරියේ තම ගෞරවයට හානි වන පරිදි නුසුදුසු වචන භාවිතා කරමින් තර්ජනාත්මක ස්වරූපයෙන් හැසුරුණු බවත්, එකී සිදුවීමෙන් පසුව මේ පිළිබඳව තමා සොයා බැලූ නමුත් එවැනි ආකාරයේ පහරදීමක් සිදුවී නැති බවත් දක්වා ඇත.

**විමර්ශනය :-**

පැමිණිලිකරු මූලිකවම කොමිෂන් සභාවේ අවධානයට යොමු කර ඇත්තේ තම දරුවාට පහරදී අවමානයට ලක් කිරීමත්, දරුවා මානසික හා කායික වධහිංසාවට පත් කිරීමත් යන කරුණුය.

මෙම සිදුවීමෙන් පසු අගතියට පත් තැනැත්තා පාසල වෙත යාම ප්‍රතික්ෂේප කිරීම යන කාරණය තුළින් දරුවාගේ අධ්‍යාපනයට ඇති අයිතිය උල්ලංඝනය වීම යන කරුණ කෙරෙහි කොමිෂන් සභාව මූලික අවධානය යොමු කර ඇත.

ඒ අනුව පරීක්ෂණයේදී ඒ පිළිබඳ අවධානයට ලක් කර ඇති අතර, වගඋත්තර පාර්ශවය ලබා දී ඇති පැමිණීමේ ලේඛනය හා වාර විභාගයට සහභාගී වූ බවට ලබා දුන් සාක්ෂි කෙරෙහි අවධානය යොමු කිරීමේදී අතෘප්තියට පත් තැනැත්තා පාසල් යාමේ කඩවීමක් දක්නට නොමැති බව නිරීක්ෂණය වී ඇත.

මීළගට කොමිෂන් සභාවේ අවධානය යොමු කර ඇත්තේ පහරදී වධහිංසාවට ලක්කිරීම යන කාරණය සම්බන්ධයෙන් වේ. ඒ අනුව, කොමිෂන් සභාව විසින් දෙපාර්ශවයේ ලිඛිත කරුණු හා සාක්ෂි කැඳවීම් කරන ලද අතර, පහරදීමට අදාළව ප්‍රතිකාර ගත් බවට දැක්වූ කරුණු අනුව අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවීම් කර ඇත. පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ මානසික වෛද්‍යවරයකු වෙතින් ගත් වෛද්‍ය වාර්තාවද අවධානයට ලක් කර ඇත.

මෙහිදී දෙපාර්ශවය විසින් දක්වන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී අගතියට පත් පාර්ශවය දක්වා ඇත්තේ අගතියට පත් තැනැත්තාගේ හිසකෙස් පමණට වඩා වැඩිවී තිබීම දක්වමින් පලවන වගඋත්තරකරු විසින් කණට හා කම්මුල ආශ්‍රිතව පහරදීමක් කළ බවයි.

වගඋත්තරකාර පාර්ශවය දක්වා ඇත්තේ කොණ්ඩය පාසලට උචිත නොවන අන්දමට වවා තිබීම මත, පාසලේ විනය පවත්වාගෙන යාමේ අරමුණින් කරන ලද සත්භාවී තරවටු කිරීමක් හැර පහරදීමක් නොකළ බවයි. එසේම වගඋත්තර පාර්ශවය ඒ පිළිබඳ සනාථ කිරීමට ඇසින් දුටු දිවුරුම් සාක්ෂි දෙකක් ඉදිරිපත් කර ඇති අතර, එම දිවුරුම් ප්‍රකාශ ඒ අවස්ථාවේ එම ස්ථානයේ සිටි ගුරුවරයෙකු වන ලක්ෂ්මන් කුමාර පෙරේරා මයා හා ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායකයෙකු වන චක්‍රාංග ජයසංක සිසුවා විසින් ඉදිරිපත් කර ඇත. ඔවුන් දෙදෙනාම දක්වා ඇත්තේ කොණ්ඩය කැපීමේ උපදෙස් නොපිළිපදින කිහිපදෙනෙකුටද අතික් සිසුනට පෙනෙන පරිදි නියෝජ්‍ය විදුහල්පතිවරයා විසින් දැඩි ලෙස අවවාද කොට තරවටු කරන ලද බවයි.

ඒ අනුව උක්ත දෙපාර්ශවයේම කරුණු අනුව කොණ්ඩය පමණට වඩා වැවී තිබීම නිසා ඒ පිළිබඳ අගතියට පත් පාර්ශවය සම්බන්ධව සිද්ධිමය අවස්ථාවක් ඇති වූ බව නිරීක්ෂණය වන අතර, එම සිද්ධියට අදාලව පහරදීමක් වූ බවට පැමිණිල්ල විසින් දක්වා ඇති නමුත් වගඋත්තර පාර්ශවය දක්වා ඇත්තේ දැඩි තරවටු කිරීමක් කළ බවට වේ.

මෙහිදී පහරදීමක් සිදුවූ බව සනාථ කිරීමට පැමිණිලිකාර පාර්ශවය වෛද්‍ය ප්‍රතිකාර ගැනීම් සඳහා යොමු වීමට අදාළ ලේඛන ඉදිරිපත් කර ඇත. 2015.05.27 දින අගතියට පත් පාර්ශවයට පලවන වගඋත්තරකරු පහරදීම නිසා පාසලේ වෛද්‍ය මධ්‍යස්ථානයේ වෛද්‍යවරයා වෙත යොමු කර ලබා ගත් ලේඛනය ගැන අවධානයට යොමු කිරීමේදී අදාළ වෛද්‍යවරයා (බිරුෆන්.) Brufen හා Omeprazole (ඔම්ප්‍රසොල්) යන බෙහෙත් ලබා ගැනීමට සලස්වා ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව එහිදී ලබාදී ඇති ඖෂධ සැලකීමේදී තද කැක්කුමට ලබා දෙන ප්‍රතිකාර ලබා දී ඇති අතර, පාසලෙන් ලබා ගත් වෛද්‍ය ප්‍රතිකාර පිළිබඳ ප්‍රතික්ෂේප කිරීමක් වගඋත්තර පාර්ශවය විසින්ද සිදු කර නොමැත.

එසේම අගතියට පත් පාර්ශවය රෝහල් ගතවීමෙන් පසුව අධිකරණ වෛද්‍යවරයා පරීක්ෂාවෙන් පසු ලද අධිකරණ වෛද්‍ය වාර්තාව කෙරෙහි අවධානය යොමු කිරීමේදී අධිකරණ වෛද්‍යවරයා 2015.05.28 දින අගතියට පත් තැනැත්තා පරීක්ෂා කර ඇති අතර, එහිදී රෝගී ඉතිහාසය ලෙස දක්වා ඇත්තේ "2015.05.27 දින පෙ. ව. 8.00 ට පමණ වෙදගේ නම් ගුරුවරයා විසින් තම වම් කණ හා හිසට අතින් පහර දුන් බවයි."

- අධිකරණ වෛද්‍ය වාර්තාවේ තුවාලයන් ලෙස දක්වා ඇත්තේ කණේ කන් බෙරය තුවාල වී නොමැති බවත් පීඩාවට හසු වී නැති බවත්. මෘදු මෙලොක්වීමක් පටහා පටලයේ (tympanic) membrane හි ඇති බවත්ය. (tympanic membrane (ear drum) is intact and not injured. Only the mild tenderness on tympanic membrane.) එසේම එය මොට ආයුධයකින් සිදු වූ තුවාලයක් බව දක්වා ඇත.

- ඒ අනුව අධිකරණ වෛද්‍යවරයා විසින් මොට ආයුධයකින් විය හැකි තුවාලයක් බව දක්වා ඇති අතර. එම අගතියට පත් තැනැත්තා දක්වන පහරදීම් ආකාරය (අතින් පහරදීම) හා පහරදීම් කළ ස්ථානය (කණ හා කම්මුල ආශ්‍රිත ප්‍රදේශය) හා සැසඳේ. මෙම තුවාල පිළිබඳ වෛද්‍යවරයාගේ මතය විමසීමේදී මෙම තුවාල ලබාදී ඇති රෝගී ඉතිහාසය හා සැසඳෙන බවද අධිකරණ වෛද්‍ය වාර්තාවේ දක්වා ඇත. ඒ අනුව දෙපාර්ශවය එකග වන සිද්ධිමය කාරණයේදී අගතියට පත් පාර්ශවය දක්වන පහරදීමක් වූ බවට වන කාරණය අදාල වෛද්‍ය වාර්තාව අනුව සනාථ වේ.

- ඊට අමතරව පැමිණිලිකාර පාර්ශවය විසින් අගතියට පත් තැනැත්තා මානසික වෛද්‍යවරයෙකු වෙත යොමු කර ඇති අතර. 2015.05.15 වන දින පරීක්ෂා කිරීමේදී Acute Stress disorder තත්ත්වයක් මෙම පහරදීම නිසා සිදු වී ඇති බව වෛද්‍ය පරීක්ෂාවේදී අවධානයට ලක් වූ බව දක්වා ඇති අතර. 2015.12.09 පරීක්ෂා කිරීමේදී මෙම අගතියට පත් තැනැත්තාට දිගටම ඇතිවන අනපේක්ෂිත බියක් ඇති බව දක්වා ඇත. (He was continuously have some anticipatory fear)

- ඒ අනුව මෙම පහරදීම නිසා අගතියට පත් තැනැත්තා මානසිකව හිංසනයට පත්වී ඇති බව මානසික වෛද්‍යවරයා විසින් වාර්තා ගත කර ඇත.

දෙපාර්ශවයේ කරුණු අනුව සිදුවීමක් සිදු වී ඇති බව තහවුරු වන අතර එහිදී සිදුවීමට අදාලව වගඋත්තර පාර්ශවය තදින් තරවටු කිරීමක් කළ බව දක්වා ඇති නමුත්. එම සිදුවීමේදී පහරදීමක් වූ බවට පැමිණිල්ල දක්වන කාරණය ප්‍රබල සාක්ෂිය වන වෛද්‍ය වාර්තා මගින් තහවුරු කර ඇත. එසේම. පැමිණිලිකාර පාර්ශවය පහරදීමට ලක්වීමෙන් පසු ලබා ගත් ඡායාරූප සාක්ෂි ඉදිරිපත් කර ඇති නමුත්. පැමිණිලිකාර පාර්ශවයට එහි මූලය කොමිෂන් සභාවට ලබාදීමට දන්වා සිටී. නමුත් එය ඉදිරිපත් කිරීමට අපොහොසත්වීම නිසා එම ඡායාරූප සාක්ෂිවලින් බැහැර කරනු ලැබේ.

එසේම, වගඋත්තර පාර්ශවය කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශ මගින් තහවුරු කර ඇත්තේ විනය පවත්වාගැනීමට සඳහා තදින් තරවටු කිරීමක් පමණක් කළ බව වේ. නමුත් එම තදින් තරවටු කිරීම පිළිබඳ මෙහිදී ප්‍රශ්න සහගත වේ. එසේම, වගඋත්තර පාර්ශවය කොමිෂන් සභාවට ලබා දුන් දිවුරුම් ප්‍රකාශවල දක්වා ඇත්තේ මීට පෙර අවස්ථා කීපයකදී ශිෂ්‍ය නායකයින් මෙම සිසුවාට කොණ්ඩය වවා තිබීම පිළිබඳ අවවාද කළ බවයි. නමුත් ඒ බව තහවුරු කිරීමට කිසිදු සාක්ෂි සැපයීමක් නොවන අතර, පාසලක මෙවැනි තත්ත්වයක් දෙමාපියන්ට දැන්වීමට ශිෂ්‍ය අත්පොත (Student Record book) භාවිතා කලේ නම් මීට පෙර මෙම තත්ත්වය (කොණ්ඩය වවා පාසලට පැමිණීම) දෙමාපියන්ට දැන්වීමට තිබුණු බව නිරීක්ෂණය වේ.

පාසල තුළ විනය ආරක්ෂා කිරීම සඳහා වූ 2005/17 චක්‍රලේඛනයේදීද පැහැදිළිව දක්වා ඇත්තේ පාසල තුළ සිදුවන හිංසන නිසා ළමයකුගේ මුළු ජීවිතයම අඳුරුවිය හැකි බවයි. ඒ බව ***පරාක්‍රමගේ ඩග්ලස් බණ්ඩාර එදිරිව එස්. වික්‍රමසිංහ, නියෝජ්‍ය විදුහල්පති, බත්තරමුල්ල ශ්‍රී විභූති මධ්‍ය මහා විද්‍යාලය හා තවත් අය SC (FR) 190/94*** නඩුවේදීද දක්වා ඇත.

එසේම, පාසලේ විදුහල්පතිවරයාට පාසැල් ළමුන් පිළිබඳව වගකීමක් ඇති අතර, 2005/17 චක්‍රලේඛනය නිසියාකාරව ක්‍රියාත්මක කිරීමේ වගකීමද විදුහල්පති සතු වන අතර, මෙවැනි පහරදීමක් පිළිබඳ තොරතුරු ලද පසු ඒ පිළිබඳව සොයා බැලූ බවත්, එවැනි පහරදීමක් වාර්තා නොවීම දැක්වීම ප්‍රමාණවත්ද යන කාරණය මෙහිදී ප්‍රශ්නගත වේ.

මෙකී කරුණු අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට දී ඇති පැමිණිලිකරුගේ දරුවා වන මෙහි අගතියට පත් අයගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

1. 2005/17 චක්‍රලේඛනය පාසලට අදාළ කරගැනීමේ ක්‍රමවේදයන් සකස් කිරීම දෙවන වගඋත්තරකරු වන පාසලේ විදුහල්පතිගේ වගකීම වන අතර, ඒ පිළිබඳ යම් දීර්ඝකාලීන වැඩපිළවෙලක් සකස් කර කොමිෂන් සභාව දැනුවත් කිරීමට කටයුතු කළයුතු බවට මෙයින් දන්වමු.

2. අගතියට පත් සිසුවාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන ලද පළවන වගඋත්තරකාර ගුරුවරයා පිළිබඳව සුදුසු විනය ක්‍රියාමාර්ගයක් ගැනීම පිණිස අධ්‍යාපන අමාත්‍යංශය විසින් කටයුතු බවට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙයින් දන්වා සිටිමු.

2016.07.30 දිනට පෙර ඉහත කී නිර්දේශයේ (1) අනුව කටයුතු කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස පළවන හා දෙවන වගඋත්තරකරුවන් වෙත ද, මෙකී නිර්දේශයේ (2) පරිදි කටයුතු කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්වරයා වෙතද 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව දන්වා සිටිමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lan

B/R3